# Energizer®




# ENERGY S550




1.1




1.2




**2.1**




**2.2**




**2.3**




**3.1**




**3.2**

## ඔබගේ ජංගම දුරකථනය හඳුන්වාදීම

ඔබගේ ජංගම දුරකථනයේ යතුරු, ප්‍රදර්ශකය සහ අයිකන හඳුනා ගන්න.

---

### යතුරු

ඔබගේ දුරකථනයේ පහත සඳහන් අංග දක්නට ලැබෙනවා ඇත:

(1.1 –3 පිටුව බලන්න)

පහත වගුව ඔබට දුරකථනයේ යතුරු පිළිබඳ කෙටි විස්තරයක් සපයයි:

| අයතමය | යතුර | කාර්යය |
|---|---|---|
| **1** | **විදුලි සැපයුම් බොත්තම (Power Button)** | උපකරණය ක්‍රියාත්මක කිරීමට / ක්‍රියා විරහිත කිරීමට සහ තිරය ලොක් කිරීමට ඉඩ සලසයි. |
| **2** | **ශබ්ද පාලන බොත්තම (Volume Button)** | දුරකථන නාදයේ සහ පණිවිඩ නාදයේ මට්ටම අවශ්‍ය පරිදි පාලනය කිරීමට ඉඩ සලසයි. එමෙන්ම, බහු මාධ්‍ය ගොනු නැවත වාදනය කිරීමේදී (Multimedia Content Playback) ශබ්ද මට්ටම අවශ්‍ය පරිදි සකසා ගැනීමට ඉඩ සලසයි. |
| **3** | **ආපසු යන බොත්තම (Back Button)** | පූර්ව මෙනුවට හෝ තිරයට නැවත යාමට ඉඩ සලසයි. එමෙන්ම, යම් යම් යෙදුම් වසා ඉවත් වීමටද ඉඩ සලසයි. |
| **4** | **මුලට යන බොත්තම (Home Key)** | විවෘත කර ඇති යෙදුම් එලෙසම තිබියදී, මෙය සෘජුව ඔබව මුලට (Home) තිරය වෙත රැගෙන යයි. |
| **5** | **මෙනු බොත්තම (Menu Button)** | ඔබ සිටින යෙදුමේ හෝ තිරයේ කාර්යය මෙනුවට (Functions Menu) ප්‍රවේශවීමට ඉඩ සලසයි. |

## තිරය (Screen)

ඔබගේ ජංගම දුරකථනයේ තිරය පහත පරිදි සැලසුම් කර ඇත:
(1.2 –3පිටුව බලන්න)

## අයිකන (Icons)

දුරකථනයේ විවිධ අංගවල ක්‍රියාකාරී මට්ටම පෙන්නුම් කරමින් තිරයේ ඉහළ දිස්වන අයිකන පිළිබඳව දැන ගන්න:

| | | | |
|---|---|---|---|
|  | සිග්නල් ප්‍රබලත්වය |  | වයි-ෆයි සබඳතාව |
|  | බ්ලූටූත් සක්‍රීයව ඇත. |  | USB සම්බන්ධ කර ඇත. |
|  | බැටරි මීටරය |  | අලුත් පණිවිඩයකි. |
|  | වයිබ්‍රේෂන් තත්වය |  | අලුත් ඊ මේල් පණිවිඩයකි. |
|  | රෝමින් ක්‍රියාකාරීත්වය |  | එලාම් ක්‍රියාත්මකයි. |
|  | හෙඩ්සෙට් සම්බන්ධ කර ඇත. |  | හඬ නිහඬ කර ඇත. |

## ඔබගේ ජංගම දුරකථනය සූදානම් කිරීම

ඔබගේ ජංගම දුරකථනය පළමු වරට භාවිත කිරීම සඳහා සූදානම් කිරීම

---

### සිම්පත සහ බැටරිය ඇතුල් කිරීම

ඔබ සෙලියුලර් දුරකථන සේවාවක ග්‍රාහකත්වය ලැබූ පසු, ඔබගේ පුද්ගලික හඳුනා ගැනීම් අංකය (PIN) සහ විකල්ප සේවා වැනි ග්‍රාහක විස්තර සමග ඔබට ග්‍රාහක හඳුනා ගැනීම් මොඩියුලපතක් හෙවත් සිම්පතක් ලැබෙනු ඇත.

සිම්පත සහ බැටරිය ඇතුල් කිරීම සඳහා,

1. බැටරි ආවරණය ඉවත් කරන්න.

(2.1–4 පිටුව බලන්න)

2. සිම්පත ඇතුල් කරන්න.

ඔබට සිම්පත් 2ක් භාවිත කිරීමට සහ ඒවා මාරුවෙන් මාරුවට භාවිත කිරීමට හැකිවනු පිණිස ඔබගේ දුරකථනයේ සිම්පත් ඇතුල් කළ හැකි ස්ථාන 2ක් ඇත.

(2.2–4 පිටුව බලන්න)

- රන් පැහැති සම්බන්ධක යටිපැත්තට සිටින සේ සිම්පත දුරකථනයට ඇතුල් කරන්න.
- සිම්පතක් ඇතුල් නොකර ඔබට ඔබගේ රකථනයේ ජාලමය නොවන සේවා සහ සමහර මෙනු භාවිත කළ හැකිය.

3. බැටරිය ඇතුල් කරන්න.

(2.3 –4 පිටුවබලන්න)

4. බැටරි ආවරණය නැවත සවි කරන්න.

**මතකපතක් ඇතුල් කිරීම (අවශ්‍යනම් පමණක්)**

අමතර මල්ටි මීඩියා ගොනු ගබඩා කිරීමට අවශ්‍යනම්, ඔබ මතකපතක් ඇතුල් කළ යුතුය.

- මතකපත පරිගණකයකින් ෆෝමැට් කිරීමෙන් එය දුරකථනය හා සංගත නොවන තත්වයක් ඇතිවිය හැකිය. මතකපත දුරකථනය මගින්ම ෆෝමැට් කළ යුතුය.

1. බැටරි ආවරණය ඉවත් කරන්න.

(3.1 –5 පිටුව බලන්න)

2. ලේබලය ඇති පැත්ත උඩට සිටින සේ මතක රඳවනය (Memory Holder) ඇතුල් කරන්න.

(3.2 –5 පිටුව බලන්න)

## මූලික කාර්යයන් සිදු කිරීම

ඔබගේ ජංගම දුරකථනයේ මූලික ක්‍රියාකාරීත්වය ගැන දැන ගන්න.

---

### ඔබගේ දුරකථනය ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියා විරහිත කිරීම

ඔබගේ දුරකථනය ක්‍රියාත්මක කිරීම සඳහා,

1. විදුලි සැපයුම් බොත්තම (Power Button) වැඩි වෙලාවක් ඔබාගෙන සිටින්න.
2. ඔබගේ පුද්ගලික හඳුනා ගැනීම් අංකය (PIN No.) ටයිප් කර OK බොත්තම ඔබන්න (අවශ්‍යනම්).

ඔබගේ දුරකථනය ක්‍රියා විරහිත කිරීම සඳහා, ඉහත 1 වන පියවර අනුගමනය කරන්න.

### මෙනු සහ යෙදුම්වලට ප්‍රවේශය

මෙනු සහ යෙදුම්වලට ප්‍රවේශවීම සඳහා,

1. ඔබගේ දුරකථනයට එකතු කර ඇති යෙදුම් ලැයිස්තුව දැක ගැනීම සඳහා Home තිරයට ගොස් එහි දිස්වන  බොත්තම ඔබන්න.
2. අනෙකුත් යෙදුම් පිටු කරා යෑම සඳහා ඔබගේ ඇඟිල්ල තිරය මත දකුණට හෝ වමට යවන්න.
3. ඕනෑම යෙදුමකට ප්‍රවේශවීම සඳහා, අයිකනය ස්පර්ශ කරන්න.
4. යෙදුමෙන් ඉවත්වීම සඳහා, තිරයේ පහතින් ඇති ආපසු (Back) හෝ මුලට (Home) සලකුණු ඔබන්න.

### මූලික ඇමතුම් කාර්යයන් භාවිත කිරීම

ඇමතුම් ලබා ගැනීම සහ ඇමතුම් සඳහා පිළිතුරුදීම පිළිබඳව දැනගන්න.

**ඇමතුමක් ලබා ගැනීම:**

1. මුල් තිරයේ හෝ යෙදුම් මෙනුවේ දිස්වන දුරකථන අයිකනය  ඇඟිල්ලෙන් ස්පර්ශ කරන්න.

2. ප්‍රාදේශීය අංකය සහ දුරකථන අංකය සඳහන් කරන්න.

3. ඇමතුම ලබාගැනීම සඳහා  සලකුණ ස්පර්ශ කරන්න.

4. ඇමතුම අවසන් කිරීම සඳහා  සලකුණ ස්පර්ශ කරන්න.

**ඇමතුම් සඳහා පිළිතුරු දීම:**

1. ඔබට ඇමතුමක් ලැබෙන විට, එයට පිළිතුරු දීම සඳහා දුරකථන අයිකනය දකුණු දෙසට ඇඟිල්ලෙන් යවන්න. ඇමතුම ප්‍රතික්ෂේප කිරීම සඳහා අයිකනය වම්පසට යවන්න .

2. ඇමතුම අවසන් කිරීම සඳහා  සලකුණ ස්පර්ශ කරන්න.

**පණිවිඩ යැවීම සහ පණිවිඩ බලා ගැනීම**

මෙම කොටසින්, පණිවිඩ යැවීම සහ ලබාගැනීම පිළිබඳව දැන ගන්න:

- පණිවිඩ පාඨ (SMS)

- බහුවිධ මාධ්‍ය පණිවිඩ (MMS)

**පණිවිඩ පාඨ සහ මල්ටි මීඩියා පණිවිඩ යැවීමේ පිළිවෙල:**

1. යෙදුම් ලැයිස්තුවේ ඇති පණිවිඩ අයිකනය ස්පර්ශ කර කොනට වන්නට ඇති සලකුණ ස්පර්ශ කරන්න.

2. අදාළ ස්ථානයේ දුරකථන අංකය හෝ අමතන්නාගේ නම ටයිප් කරන්න නැතිනම් සබඳතා ලැයිස්තුව වෙත ප්‍රවේශ වීම සඳහා සලකුණ ස්පර්ශ කරන්න.

3. ඔබගේ පණිවිඩය ටයිප් කරන්න.

පණිවිඩ පාඨයක් වශයෙන් යැවීම සඳහා 5 වන පියවර අනුගමනය කරන්න.

මල්ටි මීඩියා අයතමයක් (ශ්‍රව්‍ය අයතමයක්, ඡායාරූපයක් වැනි) ඒ සමග යැවීම සඳහා 4 වන පියවර අනුගමනය කරන්න.

4. පාඨයෙන් වම්පසට වන්නට ඇති සලකුණ ස්පර්ශ කර ඇමුණුම් වර්ගය තෝරාගත් පසු අයතමය තෝරා ගන්න.

5. පණිවිඩය යැවීම සඳහා සලකුණ ස්පර්ශ කරන්න.

**සබඳතා ලැයිස්තුවට එකතු කර ගැනීම්**

Phone book අංගය භාවිත කිරීම පිළිබඳ මූලිකාංග දැන ගන්න.

**සබඳතා ලැයිස්තුවට නව සබඳතාවක් එක් කිරීම:**

1. යෙදුම් ලැයිස්තුවේ ඇති සබඳතා සලකුණ ස්පර්ශ කර, නව සබඳතාවක් එක් කිරීම පිණිස එහි පහළට වන්නට ඇති සලකුණද ස්පර්ශ කරන්න.

2. සබඳතාව පිළිබඳ තොරතුරු (නම, අවසානයට යෙදෙන නම සහ දුරකථන අංකය) සඳහන්කරන්න. ඊමේල්, ලිපිනය වැනි විස්තරද ඔබට එක් කළ හැකියි.

3. සේව් කිරීම සඳහා තිරයේ ඉහළ දිස්වන  සලකුණ ස්පර්ශ කරන්න.

**සබඳතාවක් සෙවීම**

1. යෙදුම් ලැයිස්තුවේ ඇති සබඳතා සලකුණ  ස්පර්ශ කරන්න.

2. පහළ සිට ඉහළට ඇඟිල්ල යවමින් සබඳතා ලැයිස්තුව අනුචලනය කරමින් සබඳතාව සොයාගන්න. නැතහොත් සෙවුම් බොත්තම  ස්පර්ශ කර සොයන්න. මෙහි පළමු අකුරු හෝ අවසන් නම ටයිප් කරන්න.

3. සබඳතා පිළිබඳ විස්තර බලා ගැනීම සඳහා, සබඳතාවේ නම හෝ ඡායාරූපය ස්පර්ශ කරන්න.

ඔබට සබඳතාවක් ඇමතීමට අවශ්‍යනම් දුරකථන අංකය ස්පර්ශ කරන්න.

**සංගීතයට සවන් දීම**

මියුසික් ප්ලේයර් හෝ FM ගුවන්විදුලි යන්ත්‍රය හරහා සංගීතයට සවන් දෙන අකාරය දැනගන්න.

## FM ගුවන්විදුලි යන්ත්‍රයට සවන් දීම:

1. ඔබගේ දුරකථනයට ඉයර් ෆෝන සම්බන්ධ කරන්න.

2. යෙදුම් ලැයිස්තුවේ ඇති FM ගුවන්විදුලි යන්ත්‍ර සලකුණ  ස්පර්ශ කරන්න.

3. ගුවන්විදුලි නාලිකාව වෙනස් කිරීම සඳහා පහළ ඇති මෙවලම් තීරුව භාවිත කරන්න.

**සංගීත ගොනුවලට සවන් දීම:**

පළමුව සංගීත ගොනු දුරකථනයේ අභ්‍යන්තර මතකයට හෝ මයික්‍රෝ SD පතට කොපි කර ගන්න.

1. යෙදුම් ලැයිස්තුවේ ඇති සංගීත සලකුණ  ස්පර්ශ කරන්න.

2. තිරයේ ඉහළ දිස්වන අනුක්‍රමික රටාවක් තෝරාගෙන ඔබට සවන්දීමට අවශ්‍ය ගීතය ස්පර්ශ කරන්න.

3. පහතින් දිස්වන මෙවලම් තීරුව භාවිත කර ගීතය නැවත්වීමට, නැවත ඇසීමට හෝ වෙනස් කිරීමට ඔබට හැකිය.

## අන්තර් ජාලයේ සැරි සැරීම

ඔබගේ ප්‍රියතම තොරතුරු අඩවිවලට ප්‍රවේශ වන අයුරු දැන ගන්න.

1. යෙදුම් ලැයිස්තුවේ ඇති බ්‍රව්සර සලකුණ ස්පර්ශ කරන්න.

2. ලිපින තීරය ස්පර්ශ කර ඔබට පිවිසීමට අවශ්‍ය තොරතුරු අඩවියේ ලිපිනය ටයිප් කරන්න.

## කැමරාව භාවිත කිරීම

ඡායාරූප ගැනීම සහ ගත් ඡායාරූප බැලීම පිළිබඳ මූලිකාංග ගැන දැන ගන්න.

---

### ඡායාරූප ගැනීම

1. යෙදුම් ලැයිස්තුවේ ඇති කැමරා සලකුණ ස්පර්ශ කරන්න.

2. ඡායාරූප ඉලක්කයේ ඇති කාච අවශ්‍ය පරිදි සකස් කර Settings බොත්තම ස්පර්ශ කිරීමෙන් අවශ්‍ය වෙනස්කම් කර ගන්න.

3. ඡායාරූපය ගැනීම සඳහා, තිරයේ දිස්වන Shot බොත්තම ස්පර්ශ කරන්න. ඡායාරූපය ස්වයංක්‍රීයව සේව් වනු ඇත.

### ගත් ඡායාරූප බැලීම

යෙදුම් ලැයිස්තුවේ ඇති Gallery සලකුණ ස්පර්ශ කරන්න. ඉන්පසු ඔබගේ දුරකථනයෙන් ගත් සියලුම ඡායාරූප වෙත ප්‍රවේශ වී බලාගැනීම සඳහා කැමරා ෆෝල්ඩරය තෝරාගන්න.

**අන්තර් ජාලය හා සම්බන්ධ වීම**

ඔබගේ දුරකථනය වින්‍යාස කර අන්තර්ජාලය හා සම්බන්ධවීම පිළිබඳ මූලිකාංග ගැන දැනගන්න.

---

**නව සබඳතාවක් එක් කිරීම**

1. උපකරණයේ වින්‍යාසය කරා ප්‍රවේශ වීම සඳහා යෙදුම් ලැයිස්තුවේ ඇති Settings සලකුණ  ස්පර්ශ කරන්න.

2. "More…"විකල්පය ස්පර්ශ කර ඉන්පසු Mobile networks ද අනතුරුව ප්‍රවේශ ස්ථාන නාමය ද (APN) ස්පර්ශ කරන්න. දැන් ඔබට වින්‍යාස කිරීමට අවශ්‍ය සිම්පත තෝරා ගන්න.

3. Menu key ස්පර්ශ කර New APN තෝරා ගන්න. ඉන්පසු ඔබගේ වාහකය අනුව අදාළ පරාමිතියන් ටයිප් කරන්න.

මූලික පරාමිතියන් වන්නේ:

- නම
- ප්‍රවේශ ස්ථාන නාමය (APN)
- පරිශීලක නාමය
- මුර පදය

සමහර වාහක නියුතු සේවාදායකය (Proxy Servers) යොදා ගන්නා නිසා වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා ඔබගේ වාහකයේ වින්‍යාසය බලන්න.

4. අවශ්‍ය පරාමිතියන් ටයිප් කර අවසන් වූ පසු Menu සහ ඉන්පසු Save ස්පර්ශ කරන්න.

එකම සිම්පත සඳහා ඔබට විවිධ ප්‍රවේශ ස්ථාන නාම (APN) වින්‍යාස ඇත්නම්, නමේ දකුණු පැත්තට වන්නට ඇති රේඩියෝ බොත්තම  ස්පර්ශ කර ඔබට භාවිත කිරීමට අවශ්‍ය වින්‍යාසය තෝරා ගන්න.

තවත් සබඳතාවක් එක්කර ගැනීම පිණිස, 3වන පියවරෙහි සිට ඇති පියවර යළි පිළිපදින්න.

## වාහක අතර මාරුවීම (සිම්පත්)

ඔබ විවිධ සිම්පත් භාවිත කරන්නේනම් සහ තවත් සිම්පතකට මාරුවීමට අවශ්‍ය නම්, මෙම පියවර අනුගමනය කරන්න:

1. උපකරණයේ වින්‍යාසයට ප්‍රවේශ වීම සඳහා යෙදුම් ලැයිස්තුවේ ඇති Settings අයිකනය  ස්පර්ශ කරන්න.

2. සිම්පත් අයිකනය ස්පර්ශ කරන්න. 


3. විකල්ප දත්ත සබඳතාව තෝරාගෙන (Option Data Connection) ඔබට භාවිත කිරීමට අවශ්‍ය සිම්පත තෝරා ගන්න.

## වයි-ෆයි සබඳතාව භාවිතකිරීම

අනුරූපී ගැලපෙන රැහැන් රහිත ප්‍රාදේශීය ජාලයක් හා සම්බන්ධවීම සඳහා දුරකථනයේ රැහැන් රහිත සබඳතා හැකියාවන් භාවිත කරන ආකාරය ගැන දැනගන්න.

---

### රැහැන් රහිත ජාලයක් හා සම්බන්ධ වීම

1. උපකරණයේ වින්‍යාසයට ප්‍රවේශ වීම සඳහා, යෙදුම් ලැයිස්තුවේ ඇති  Settings අයිකනය ස්පර්ශ කරන්න.

2. වයි-ෆයි විකල්ප සලකුණ 

ස්පර්ශ කරන්න.

3. වයි-ෆයි ක්‍රියාත්මක කිරීම සඳහා, ඉහළ දකුණු කෙලවරේ ඇති බොත්තම  ස්පර්ශ කරන්න.

4. රැහැන් රහිත ජාලයක් තෝරාගෙන අවශ්‍යනම් ආරක්ෂිත මුර පදය ඇතුල් කරන්න.

### රැහැන් රහිත ජාලයෙන් බැහැරවීම

1. උපකරණයේ වින්‍යාසයට ප්‍රවේශ වීම සඳහා, යෙදුම් ලැයිස්තුවේ ඇති  Settings අයිකනය ස්පර්ශ කරන්න.

2. වයි-ෆයි විකල්ප සලකුණ 

ස්පර්ශ කරන්න.

3. වයි-ෆයි ක්‍රියා විරහිත කිරීම සඳහා, ඉහළ දකුණු කෙලවරේ ඇති බොත්තම  ස්පර්ශ කරන්න.

**රැහැන් රහිත ජාලයක තාක්ෂණික තොරතුරු බලා ගැනීම**

1. උපකරණයේ වින්‍යාසයට ප්‍රවේශ වීම සඳහා, යෙදුම් ලැයිස්තුවේ ඇති Settings අයිකනය  ස්පර්ශ කරන්න.

2. වයි-ෆයි විකල්ප සලකුණ 

ස්පර්ශ කරන්න.

3. සබඳතාවෙහි වේගය, සිග්නල් ප්‍රබලත්වය ආදී විස්තර බලාගැනීම සඳහා ක්‍රියාකාරී රැහැන් රහිත ජාලය ස්පර්ශ කරන්න.

## ආරක්ෂිත පරිහරණය පිළිබඳ තොරතුරු

ඔබ දුරකථනය භාවිත කරන සෑම අවස්ථාවකදීම අදාළ නීතිරීති හා විධිවිධාන පිළිපැදීමට මතක තබාගන්න. එමගින් ඔබට මෙන්ම පරිසරයටද අහිතකර බලපෑම් ඇතිවීම වළක්වා ගත හැකිය.

### සාමාන්‍ය ආරක්ෂාව

| | |
|---|---|
|  | රිය පදවනවිට, යතුරු පැදියේ ගමන් ගන්නා විටහෝ ඇවිදින විට හෙඩ්පෝන් හෝ ඉයර්පෝන් භාවිතයෙන් වළකින්න. එමගින් ඔබගේ අවධානය වෙනතක යොමුවී අනතුරු ඇතිවිය හැකි අතරම එය සමහර භූගෝලීය ප්‍රදේශ තුළ නීතියටද පටහැනි විය හැකිය. පූර්ව ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස, රිය පදවන අතර ඔබ දුරකථනය භාවිතයෙන් වැළකී සෑමවිටම ඔබගේ වටපිටාව පිළිබඳව විමසිල්ලෙන් සිටින්න. ඔබ රිය පදවන අතරතුර දුරකථන භාවිතයට අදාළ සියලුම ආරක්ෂිත උපදෙස් සහ විධිවිධාන අනුගමනය කරන්න. |
|  | ඉන්ධන පිරවුම්හල්වලදී දුරකථනය භාවිත කිරීමෙන් වළකින්න. |
|  | ඇමතුම් ලබාගැනීමේදී දුරකථනය ඔබගේ කනෙන් හෝ සිරුරෙන් අවම වශයෙන් මි.මී. 15ක් ඈතින් තබා ගන්න. |
|  | ඔබගේ දුරකථනය දීප්තිමත් හෝ තද ආලෝකයක් නිකුත් කරනවා විය හැකිය. |
|  | එහි කුඩා කොටස් ගිලීමට ඉඩ ඇත. |
|  | ඔබගේ දුරකථනය ඉවත ලෑමේදී ගින්නට නොදමන්න. |

| | |
|---|---|
|  | ශ්‍රවන හානිය වළක්වා ගැනීම සඳහා, දිගු වේලාවක් අධික ශබ්ද මාත්‍රාවන්ට සවන් දීමෙන් වළකින්න. ඉයර්පෝන් සහ හෙඩ්පෝන්වලින් නිකුත් වන අධික ශබ්ද තරංග පීඩනය හේතුවෙන් ශ්‍රවන ශක්තිය නැතිවිය හැකිය. |
|  | චුම්බක ශක්තියෙන් යුතු දෑ සමග ගැටෙන්නට සැලසීමෙන් වළකින්න. |
|  | හෘද ස්පන්දන රටාව ක්‍රමවත් කරන උපකරණ සහ අනෙකුත් ඉලෙක්ට්‍රොනික වෛද්‍ය උපකරණවලින් ඈත්කොට තබන්න. |
|  | අධික උෂ්ණත්ව තත්වයන්ට ලක් කිරීමෙන් වළකින්න. |
|  | රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථානවලදී ඉල්ලා ඇතිවිට දුරකථනය ක්‍රියා විරහිත කරන්න. |
|  | ද්‍රව හා ගැටීමට ඉඩ නොතබන්න. ඔබගේ දුරකථනය වියළිව තබා ගන්න. |
|  | ගුවන්යානා තුළ සහ ගුවන් තොටුපොලවලදී ඉල්ලා ඇතිවිට දුරකථනය ක්‍රියා විරහිත කරන්න. |
|  | දුරකථනය කැලිවලට ගැලවීමෙන් වළකින්න. |
|  | පුපුරණ ද්‍රව්‍ය හෝ ද්‍රව අසල ඇතිවිට දුරකථනය ක්‍රියා විරහිත කරන්න. |

<table>
<tr><td></td><td>අනුමත උපාංග පමණක් යොදා ගන්න.</td></tr>
<tr><td></td><td>හදිසි අවස්ථා සන්නිවේදන කටයුතුවලදී ඔබගේ දුරකථනය මත විශ්වාසය තැබීමෙන් වළකින්න.</td></tr>
<tr><td colspan="2">ඇඩප්ටරය හානිවී ඇත්දැයි දැන ගැනීම සඳහා විශේෂයෙන්ම ජේනුව මුල සහ ආවරණය නිරතුරුව  පරීක්ෂා කර බලන්න. ඇඩප්ටරය හානිවී ඇත්නම්, එය පිළිසකර කරනතුරු ඔබට භාවිත කළ නොහැක.<br><br>ඇඩප්ටරය පහසුවෙන්ළඟාවිය හැකි විදුලි ජේනුවකට සම්බන්ධ කරන්න. පරිහරණයෙන් පසු සැමවිටම එය ජේනුවෙන් ගලවා ඉවත් කරන්න.<br><br>දුරකථනය සමග ලබාදෙන ඇඩප්ටරය පමණක් භාවිත කරන්න.</td></tr>
<tr><td></td><td>විදුලි අනතුරු පිළිබඳ අනතුරු හැඟවීම<br><br>බරපතල හානි වළක්වා ගැනීම සඳහා, ආරෝපකයේ ජේනුව ඇල්ලීමෙන් වළකින්න!<br><br>ආරෝපකය භාවිත නොකරන අවස්ථාවලදී විසන්ධි කර තබන්න.<br><br>ආරෝපකය හෝ උපාංගයක් විසන්ධි කිරීමේදී, විදුලි කේබලය නොව ජේනුව ගලවා දමන්න.<br><br>උපකරණය විසන්ධි කිරීමට උපකාරී වනකොටසවන්නේ විදුලි සැපයුම් මොඩියුලයයි.<br><br>විදුලි ජේනුව පහසුවෙන් ලංවිය හැකි තැනක තිබිය යුතුයි.</td></tr>
</table>

උදාහරණයක් වශයෙන්, මෝටර් රථයේ ඩෑෂ් පුවරුව සේ ඔබගේ උපකරණය සෘජුව හිරු එළියට නිරාවරණය වීමට ඉඩ නොහරින්න.

උපකරණය අධික ලෙස රත්වී ඇතිවිට භාවිත කිරීමෙන් වළකින්න.

ඇවිදින අතරතුර දුරකථනය භාවිත කිරීමේදී ප්‍රවේශම් වන්න.

දුරකථනය දැඩි ඝට්ටනයකට ලක්වීමට හෝ ඉහළ උසක සිට වැටීමට ඉඩ නොතබන්න. එමගින් උපකරණයට හානිවීම හෝ එය නිසි පරිදි ක්‍රියා නොකිරීම සිදුවිය හැකිය.

ඔබ එහි කෑලි වෙන්කිරීමට,නවීකරණය කිරීමට හෝ සවි කිරීමට උත්සාහ නොගන්න.

උපකරණය පිරිසිදු කිරීම සඳහා පිරිසිදු සහ සිනිඳු රෙදි කැබැල්ලක් යොදා ගන්න. ඒ සඳහා කිසිදු රසායනික නිෂ්පාදනයක් හෝ සේදුම් කාරකයක් භාවිත නොකරන්න.

# EU WEEE

පාරිභෝගිකයින් සඳහා ඉවත ලන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ පිළිබඳ යුරෝපා සංගම් විධිවිධානය අනුගමනය කිරීමට අදාළ තොරතුරු

**දුරකථනයේ ජීවිත කාලය ඉකුත් වූ වහාම, එය අපහරණය කිරීමට පෙර එහි බැටරිය ගලවා ඉවත් කරන්න.**

මෙම නිපැයුම භාවිත කළ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීයකරණය ප්‍රවර්ධනය කරන යුරෝපා සංගම් විධිවිධානවලට යටත් වේ. මෙම නිපැයුම සඳහා ස්වභාවික සම්පත් යොදා ගැනීම අවශ්‍ය වූවා සේම මෙතුළ අන්තරායකර ද්‍රව්‍ය අන්තර්ගත විය හැකිය. නිපැයුම හෝ එහි ඇසුරුම මත දැක්වෙන යථෝක්ත සලකුණ මගින් පෙන්නුම් කරනුයේ මෙය ඔබේ අනෙකුත් ගෘහස්ථ අපද්‍රව්‍ය සමග අපහරණය නොකළ යුතු බවයි. ඒ වෙනුවට, ඔබ ඉවතලන විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ ප්‍රතිචක්‍රීයකරණය කිරීම සඳහා නියමිත එක්රැස් කිරීම් මධ්‍යස්ථාන වෙත භාරදීම මගින් ඒවා අපහරණය කිරීම ඔබගේ වගකීම වේ.

ඔබ ඉවතලන උපකරණ අපහරණය කරන අවස්ථාවේ ඒවා වෙන වෙනම රැස්කර ප්‍රතිචක්‍රීයකරණය කිරීමෙන් ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමට රුකුලක් වන අතරම මිනිස් සෞඛ්‍යය සහ පරිසරය ආරක්ෂා වන අයුරින් ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය සිදු කිරීමද සහතික කෙරේ.

ඉවතලන උපකරණ ප්‍රතිචක්‍රීයකරණය සඳහා භාරදිය යුතු ස්ථාන පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා, ඔබගේ ප්‍රදේශයේ ඇති නගර කාර්යාලය, ගෘහස්ථ අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවය හෝ ඔබ නිපැයුම මිලදීගත් අලෙවිසැල අමතන්න.

**නිර්දේශ:**

- උපකරණය කෑලිවලට ගැලවීම, විවෘත කිරීම හෝ එහි බැටරි ඉවත් කිරීම නොකළ යුතුයි.

- උපකරණය හෝ බැටරිය තාපයට හෝ ගින්දරට නිරාවරණය නොකළ යුතුය. උපකරණය ඍජුව හිරු එළියට නිරාවරණය වන තැනක තැබීමෙන්ද වැළකිය යුතුයි.

- බැටරිය ලුහුවත් කිරීමෙන් වළකින්න. බැටරි එකිනෙක හා ගැටී ලුහුවත් විය හැකි හෝ වෙනත් ලෝහමය වස්තූන් සමග ගැටිය හැකි ලාච්චුවක තැබීමෙන් වළකින්න.

- බැටරිවලට යාන්ත්‍රික කම්පනය ඇති කිරීමෙන් වළකින්න.

- බැටරියේ කාන්දුවීමක් ඇතිවුවහොත්, එම දියරය ඔබගේ ඇස් හෝ සම මත තැවරීමේ ඉඩකඩ වළක්වා ගන්න. එලෙස තැවරුණහොත් එම ස්ථානය පිරිසිඳු ජලයෙන් සෝදා වෛද්‍ය උපදෙස් පතන්න.

- බැටරියේ සහ උපකරණයේ දැක්වෙන ධන (+) සහ ඍණ (-) සලකුණු අනුගමනය කර ඒවා නිවැරදිව යෙදී ඇති බව තහවුරු කර ගන්න.

- උපකරණය සඳහා භාවිත කිරීමට නිර්මාණය කර නොමැති උපාංග හෝ බැටරි යොදා ගැනීමෙන් වළකින්න.

- කුඩා ළමුන් විසින් බැටරි අතපත ගාන අවස්ථාවලදී පරීක්ෂාකාරී වන්න.

- මෙහි ඇති යම් ද්‍රව්‍යයක් හෝ බැටරියක් ගිලුණු අවස්ථාවකදී වහාම වෛද්‍යවරයෙකු හමුවන්න.

- උපකරණයේ නිෂ්පාදක විසින් නිර්දේශ කරන බැටරි පමණක් සැමවිටම මිලදී ගන්න.

- සැමවිටම උපකරණය සහ බැටරිය පිරිසිදුව සහ වියළිව තබා ගන්න.

- උපකරණයේ හෝ බැටරියේ අග කොටස් කිලිටි වී ඇත්නම් පිරිසිඳු වියළි රෙදි කැබැල්ලකින් පිස දමන්න.

- බැටරිය පරිහරණයට පෙර ආරෝපණය කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා සැමවිටම ආරෝපකය භාවිත කල යුතු අතර බැටරි ආරෝපණය සම්බන්ධ උපදෙස් උදෙසා නිෂ්පාදක උපදෙස් හෝ උපකරණයේ අත්පොත කියවා බලන්න.

- බැටරිය ප්‍රයෝජනයට නොගන්නා අවස්ථාවලදී එය ආරෝපණය කිරීමෙන් වළකින්න.

- දිගු කලක් ගබඩා කර තිබීමෙන් පසු, උපරිම ක්‍රියාකාරීත්වයක් ලබා ගැනීම සඳහා බැටරිය කිහිප වරක්ම ආරෝපණය කිරීම සහ විසර්ජනය කිරීම අවශ්‍ය විය හැකිය.

- සැමවිටම උපකරණයේ මුල් ලේඛන සුරැකිව තබා ගන්න, ඒවා පසු කලෙක කියවා බැලීම සඳහා ඔබට අවශ්‍ය විය හැකිය.

- උපකරණයේ බැටරිය භාවිත නොකරන අවස්ථාවලදී, හැකිනම්, එය ගලවා ඉවත් කර තබන්න.

- ග්‍රීෂ්ම කාලයේදී මෝටර් රථය තුළ වැනි තදින් රත්වන හෝ තදින් සිසිල් වන ස්ථානවල ඔබගේ උපකරණය තැබීමෙන් වළකින්න. එමගින් උපකරණයට හානි විය හැකි අතර බැටරිය පුපුරා යාමටද ඉඩ ඇත. සෙ. $5^{\circ}$ සහ සෙ. $35^{\circ}$ අතර උෂ්ණත්ව පරාසයක් තුළ මෙම උපකරණය පරිහරණය කිරීම නිර්දේශ කෙරේ.

**ශ්‍රවන හානි වළක්වා ගැනීම**

අධික ශබ්ද මාත්‍රාවකින් රිසීවරය, ඉයර්පෝන්, ලව්ඩ්ස්පීකරය හෝ අත් නිදහස් කට්ටලය භාවිත කළහොත්, ඔබට ප්‍රකෘතිමත් කල නොහැකි ශ්‍රවන හානියක් ඇතිවීමේ අවදානමක් පවතී. ශබ්දය හානිකර නොවන මට්ටමකට සකස් කර ගන්න. කාලයත් සමග ඔබ අධික ශබ්දයකින් උපකරණය පරිහරණය කිරීමට හුරු විය හැකි නමුත් එය ඔබගේ ශ්‍රවන ශක්තියට හානි කරනු ඇත. ඔබට කනෙහි ගුමු ගුමු ශබ්දයක් හෝ කථාව නෑසීයාමක් ඇති වන්නේනම්, එම උපාංග භාවිතය නවතා විශේෂඥ වෛද්‍යවරයෙක් හමු වන්න.
ශබ්දය වැඩිවීමත් සමගම, ඔබගේ ශ්‍රවන ශක්තියට හානිවීමේ වේගයද වැඩිවිය හැකිය.

විශේෂඥයින් විසින් පහත සඳහන් නිර්දේශ ලබාදෙනු ලැබේ:

- හෙඩ්පෝනයේ, ස්පීකරයේ හෝ අත් නිදහස් කට්ටලයේ අධික ශබ්දය අවම කරන්න.
- අධික ශබ්දයෙන් යුතු පරිසරයක් ඇති නොවනු පිණිස ශබ්දය වැඩිකිරීමෙන් වළකින්න.
- අසල සිටින්නන් කථා කරනු ඔබට නෑසෙන්නේනම් ශබ්දය අඩු කරන්න.

**විශේෂ අවශෝෂණ අනුපාතය (SAR)**

වැදගත් වන මෙම කොටස හොඳින් කියවා බලන්න.

---

**ගුවන් විදුලි තරංග**

සෑම ජංගම දුරකථන මාදිලියක්ම වෙළඳපොළට ඉදිරිපත් කිරීමට පෙර අන්තර්ජාතික ප්‍රමිති (ICNIRP) හෝ 2014/53/EU (RED) දරන යුරෝපා සංගම් විධිවිධානයට අනුකූල වන බව තහවුරු කිරීමේ සාක්ෂි අවශ්‍ය වේ. පරිශීලකගේ හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම මෙම ප්‍රමිති හෝ විධිවිධානයේ අනිවාර්ය අවශ්‍යතාවකි.

**මෙම උපකරණය ගුවන්විදුලි තරංගවලට නිරාවරණය වීම පිළිබඳ අන්තර් ජාතික මාර්ගෝපදේශ පිළිපැද ඇත.**

ඔබගේ ජංගම දුරකථනය ගුවන් විදුලි සම්ප්‍රේෂකයක් සහ ආදායකයක් වේ. එය සැලසුම් කර ඇත්තේ අන්තර් ජාතික මාර්ගෝපදේශ මගින් නිර්දේශ කරඇති ආකාරයට ගුවන්විදුලි තරංගවලට නිරාවරණය වීමේ සීමා (ගුවන්විදුලි සංඛ්‍යාත විද්‍යුත් චුම්භක ක්ෂේත්‍ර) ඉක්මවා නොයන පරිදිය. මාර්ගෝපදේශ ස්වාධීන විද්‍යාත්මක ආයතනයක් (ICNIRP) විසින් සකස් කර ඇති අතර වයස සහ සෞඛ්‍යය කෙලෙස වුවද සැමගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස සැලසුම් කළ ප්‍රමාණවත් සුරක්ෂිතතා ආන්තිකයක් ඒවායෙහි ඇතුළත්වේ.

ගුවන්විදුලි තරංගවලට නිරාවරණය වීම පිළිබඳ මාර්ගෝපදේශ තුළ විශේෂිත අවශෝෂණ අනුපාතය (SAR) වශයෙන් හඳුන්වන මිනුම් ඒකකයක් භාවිතකෙරේ. ජංගම උපකරණ සඳහා විශේෂිත අවශෝෂණ අනුපාත සීමාව (SAR limit) ක්‍රි.ග්‍රෑ. 1කට වොට් 2කි.

විශේෂිත අවශෝෂණ අනුපාත සීමාව (SAR) සම්බන්ධ පරීක්ෂා සිදු කෙරෙනුයේ උපකරණය සම්මත වශයෙන් භාවිත කරන ස්ථාන යොදා ගනිමින් එහි සහතික කළ උපරිම බල සැපයුම් මට්ටමක් ඇතිවිට පරීක්ෂා කරන ලද සියලුම සංඛ්‍යාත තීරවලදී සම්ප්‍රේෂණය කරන ආකාරය සැලකිල්ලට ගැනීමෙනි.

ගුවන්විදුලි සංඛ්‍යාතවලට නිරාවරණයවීමට අදාළ මාර්ගෝපදේශවලට අනුකූල වනු පිණිස සිරුර හා උපකරණය අතර සෙ.මී. 1.5 පරතරයකදී උපකරණය ශරීරයේ පැළඳ විශේෂිත අවශෝෂණ අනුපාත (SAR) පරීක්ෂාව සිදුකර ඇත. ශරීරයේ පැළඳ ක්‍රියා කරන අවස්ථාවකදී උපකරණය සිරුරේ සිට අවම වශයෙන් මෙකී දුරින්වත් ස්ථාන ගත කළ යුතුය. ඔබ අනුමත උපාංගයක් භාවිත නොකරන්නේ නම්, භාවිත කරන නිෂ්පාදනය කුමක් වුවද එය ලෝහවලින් තොරවිය යුතු අතර දුරකථනය සිරුරේ සිට නියමිත දුරින් ඇති බවට වග බලාගත යුතුයි.

වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා, www.energizeyourdevice.com තොරතුරු අඩවියට පිවිසෙන්න.

විද්‍යුත් චුම්බක ක්ෂේත්‍ර සහ මහජන සෞඛ්‍යය පිළිබඳ වැඩිදුර තොරතුරු පහත සඳහන් තොරතුරු අඩවියෙහි දැක්වේ.
http://www.who.int/peh-emf.

ඔබගේ දුරකථනයට සවිවර ඇන්ටනාවක් එක්කර ඇත. ප්‍රශස්ත ක්‍රියාකාරීත්වය උදෙසා, ඔබ එය ඇල්ලීමෙන් හෝ කඩා දැමීමෙන් වළකින්න.

ජංගම උපකරණ කාර්ය පරාසයකින් සමන්විත නිසා ඔබගේ කන හැර වෙනත් ස්ථානවල භාවිත කළ හැකිය. එවැනි අවස්ථාවලදී, හෙඩ්සෙට් හෝ USB දත්ත කේබල සමග භාවිත කරන විට උපකරණය මාර්ගෝපදේශවලට අනුකූලවනු ඇත. ඔබ වෙනත් උපාංගයක් භාවිත කරන්නේ නම්, භාවිත කරන නිෂ්පාදනය කුමක් වුවද එය ලෝහවලින් තොර විය යුතු අතර දුරකථනය සිරුරෙන් අවම වශයෙන් සෙ.මී. 1.5ක් ඇතින් තබන බවට වග බලාගත යුතුයි.

## යුරෝපීය අනුකූලතාව (CE)

වැදගත් වන මෙම කොටස හොඳින් කියවා බලන්න.

**ගුවන් විදුලි තරංග**

සෑම ජංගම දුරකථන මාදිළියක්ම වෙළඳපොළට ඉදිරිපත් කිරීමට පෙර අන්තර්ජාතික ප්‍රමිති (ICNIRP) හෝ 2014/53/EU (RED) දරන යුරෝපා සංගම් විධිවිධානයට අනුකූල වන බව තහවුරු කිරීමේ සාක්ෂි අවශ්‍ය වේ. පරිශීලකගේ හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම මෙම ප්‍රමිති හෝ විධිවිධානයේ අනිවාර්ය අවශ්‍යතාවකි.

**මෙම උපකරණය ගුවන්විදුලි තරංගවලට නිරාවරණය වීම පිළිබඳ අන්තර් ජාතික මාර්ගෝපදේශ පිළිපැද ඇත.**

ඔබගේ ඔබගේ ජංගම දුරකථනය ගුවන්විදුලි සම්ප්‍රේෂකයක් සහ ආදායකයක් වේ. එය සැලසුම් කර ඇත්තේ අන්තර්ජාතික මාර්ගෝපදේශ මගින් නිර්දේශ කර ඇති ආකාරයට ගුවන්විදුලි තරංගවලට නිරාවරණය වීමේ සීමා (ගුවන්විදුලි සංඛ්‍යාත විද්‍යුත් චුම්භක ක්ෂේත්‍ර) ඉක්මවා නොයන පරිදිය. මාර්ගෝපදේශ ස්වාධීන විද්‍යාත්මක ආයතනයක් (ICNIRP) විසින් සකස්කර ඇති අතර වයස සහ සෞඛ්‍යය කෙලෙස වුවද සැමගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස සැලසුම් කළ ප්‍රමාණවත් සුරක්ෂිතතා ආන්තිකයක් ඒවායෙහි ඇතුළත් වේ.

**යුරෝපා සංගම් නියාමනයට අනුකූල වීම**

මෙමගින්, මෙම උපකරණය 2014/53/EU විධිවිධානයේ අනිවාර්ය අවශ්‍යතාවලට සහ අනෙකුත් අදාළ විධිවිධානවලටඅ නුකූල වේ.

අනුකූලතා ප්‍රකාශය සඳහා, www.energizeyourdevice.com තොරතුරු අඩවියට පිවිසෙන්න.

දැන්වීම: උපකරණය භාවිත කෙරෙන ස්ථානයට අදාළ ජාතික ප්‍රාදේශීයමය විධිවිධාන අනුගමනය කරන්න. මෙම උපකරණය යුරෝපා සංගමයේ සමහර හෝ සියලුම සාමාජික රටවල් සඳහා සීමාවිය හැකිය.

සටහන්:

- භාවිත කර ඇති ප්‍රාවරණ ද්‍රව්‍යය නිසාවෙන් 2.0 හෝ ඊට ඉහළ මාදිළියක USB අතුරු මුහුණතකට පමණක් ජංගම දුරකථනය සම්බන්ධ කල යුතුය. Power USB වශයෙන් හඳුන්වන්න යොදාගනිමින් සම්බන්ධ කිරීම තහනම් වේ.

- උපකරණය අසල ඇඩප්ටරය ස්ථාපිත කල යුතු අතර එයට පහසුවෙන් ළංවීමට හැකිවිය යුතුයි.

- ජංගම දුරකථනය අධික හෝ අවම උෂ්ණත්වයක් ඇති පරිසරයක භාවිත නොකළ යුතුයි. එය කිසිවිටක දැඩි හිරු එළියට හෝ අධික තෙත් තත්වයකට නිරාවරණය නොවිය යුතුයි. දුරකථනය සහ උපාංග සඳහා යෝග්‍ය උෂ්ණත්වය සෙ. 10˚-55˚ වේ.

- දුරකථනය ආරෝපණය කරනවිට සාමාන්‍ය කාමර උෂ්ණත්වය සහ මනා වාතාශ්‍රය ඇති ස්ථානයක තැබිය යුතුයි. සෙ. 5˚-25˚ අතර උෂ්ණත්ව පරාසයක් ඇති ස්ථානයකදී දුරකථනය ආරෝපණය කිරීම නිර්දේශ කෙරේ. නිෂ්පාදක විසින් ලබාදෙන ආරෝපකය පමණක් භාවිත කිරීමට වගබලා ගන්න. අනවසර ආරෝපක භාවිත කිරීමෙන් අනතුරු ඇතිවිය හැකි අතර එමගින් දුරකථනය පිළිබඳ අවසරයද වගකීම් සහතිකයද උල්ලංඝනය වනු ඇත.

- **අනතුරු ඇඟවීම: වැරදි වර්ගයේ බැටරියක් යොදා ගැනීමෙන් දුරකථනය පුපුරා යාමේ අවදානම පවතී. පාවිච්චියෙන් ඉවත් කරන බැටරි උපදෙස්වලට අනුකූලව අපහරණය කරන්න.**

- ඉයර්පෝන් සහ හෙඩ්පෝන් මගින් නිකුත්වන අධික ශබ්දයේ බලපෑමෙන් ශ්‍රවන හානි ඇතිවිය හැකිය.

වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා, ඔබට www.energizeyourdevice.com තොරතුරු අඩවියට පිවිසිය හැකියි.

විද්‍යුත් චුම්බක ක්ෂේත්‍ර සහ මහජන සෞඛ්‍යය පිළිබඳ වැඩිදුර තොරතුරු පහත සඳහන් තොරතුරු අඩවියෙහි දැක්වේ.
http://www.who.int/peh-emf.

ඔබගේ දුරකථනයට සවිවර ඇන්ටනාවක් එක්කර ඇත. එහි ප්‍රශස්ත ක්‍රියාකාරීත්වය උදෙසා, ඔබ එය ඇල්ලීමෙන් හෝ කඩා දැමීමෙන් වළකින්න.

ජංගම උපකරණ කාර්ය පරාසයකින් සමන්විත නිසා ඔබගේ කනහැර වෙනත් ස්ථානවල භාවිත කළ හැකිය. එවැනි අවස්ථාවලදී, හෙඩ්සෙට් හෝ USB දත්ත කේබල සමග භාවිත කරනවිට උපකරණය මාර්ගෝපදේශවලට අනුකූලවනු ඇත. ඔබ වෙනත් උපාංගයක් භාවිත කරන්නේ නම්, භාවිත කරන නිෂ්පාදනය කුමක් වුවද එය ලෝහවලින් තොර විය යුතු අතර දුරකථනය සිරුරෙන් අවම වශයෙන් සෙ.මී. 1.5ක් ඈතින් තබන බවට වග බලාගත යුතුයි.

**සම්මුති සහතිකය**
**ENERGY S550**

අපි, **AVENIR TELECOM**,
(208, ප්ලොම්යර්ස් බුල්වාඩ්, 13581 මාර්සිල් සීඩෙක්ස් 20, ෆ්රැන්සිස්)
මෙසේ ප්රකාශ කරයි:

**ENERGIZER** නිපැයුම්වල ප්රමිති සහ විධිවිධාන සමග සම්පාදනය කරයි. 2014/53 / යුරෝපා සංග්රහයේ IV වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුකූලතා සහතිකය පහත සඳහන් සංවිධානයේ පාලනය යටතේ පවතී:

**BAY AREA COMPLIANCE LABORATORIES CORP.**
1274 Anvilwood Ave. Sunnyvale, CA 94089. USA
www.baclcorp.com
Phone: +1 408 732 9162 Fax: +1 408 732 9164

උපාංගය අනුකූලතා සහතිකයේ සම්පූර්ණ පිටපත පහත ලිපිනයට ඉල්ලීමක් මත ඉල්ලීම මත **AVENIR TELECOM** - 208, Boulevard de Plombières, 13581 Marseille Cedex 20, France

**2017/09/07** (Date)

**Jean-Daniel BEURNIER / CEO** (Name and signature of authorized person)

<table>
<tr><th colspan="2">මෙම ආකෘතිය සඳහා වූ උපරිම SAR සහ එය වාර්තා කරන ලද කොන්දේසි:</th></tr>
<tr><td>EGSM 900</td><td>0.153 W/kg 10g හිස SAR | 1.230 W/kg 10g සිරුර SAR</td></tr>
<tr><td>DCS 1800</td><td>0.110 W/kg 10g හිස SAR | 0.627 W/kg 10g සිරුර SAR</td></tr>
<tr><td>WCDMA 900</td><td>0.110 W/kg 10g හිස SAR | 0.460 W/kg 10g සිරුර SAR</td></tr>
<tr><td>WCDMA 2100</td><td>0.078 W/kg 10g හිස SAR | 0.382 W/kg 10g සිරුර SAR</td></tr>
<tr><td>LTE Band 3</td><td>0.278 W/kg 10g හිස SAR | 0.870 W/kg 10g සිරුර SAR</td></tr>
<tr><td>LTE Band 7</td><td>0.080 W/kg 10g හිස SAR | 0.986 W/kg 10g සිරුර SAR</td></tr>
<tr><td>LTE Band 20</td><td>0.033 W/kg 10g හිස SAR | 0.087 W/kg 10g සිරුර SAR</td></tr>
<tr><td>LTE Band 28</td><td>0.021 W/kg 10g හිස SAR | 0.086 W/kg 10g සිරුර SAR</td></tr>
</table>

විකා කිරීම අතරතුර, මෙම උපාංගය සඳහා සැබෑ SAR අගයන් බොහෝ විට ඉහත සඳහන් කළ අගය වඩා බෙහෙවින් පහත වැටේ. මෙය පද්ධතියේ කාර්යක්ෂමතාවය සහ ජාලය තුළ මැදිහත්වීම අවම කිරීම සඳහා, ඔබේ ජංගම උපාංගයේ ක්රියාකාරී බලය ස්වයංක්රිය අඩු වන විට ඇමතුම් සඳහා අවශ්ය නොවේ. උපාංගයෙහි බලන නිමැවුම අඩු වන අතර එය SAR අගය අඩු කරයි

غوغل, غوغل بلاي و العلامات الاخرى هي علامات تجارية لشركة غوغل ش.ذ.م.م

Google, Google Play and other marks are trademarks of Google LLC.

**Energizer®**

إنيرجايزر وبعض التصاميم الجرافيكية هي علامات تجارية لشركة إنرجايزر ، والشركات التابعة ذات الصلة وتستخدم بموجب ترخيص من أفينير تليكوم. جميع الأسماء التجارية الأخرى هي علامات تجارية لأصحابها. لا أفينير تليكوم ولا إنرجايزر العلامات التجارية، هي تابعة لأصحابها من علاماتها التجارية!

© 2018 Energizer. Energizer and certain graphic designs are trademarks of Energizer Brands, LLC and related subsidiaries and are used under license by Avenir Telecom©. All other brand names are trademarks of their respective owners. Neither Avenir Telecom© nor Energizer Brands, LLC is affiliated with the respective owners of their trademarks.